# රාගය ප්‍රහාණයට අසුභය වඩන්න
# ද්වේෂය ප්‍රහාණයට මෛත්‍රිය වඩන්න
# මෝහය ප්‍රහාණයට ප්‍රඥාව වඩන්න
## රාග සූත්‍රය ඇසුරින්
(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 4 - පිටු අංක 260 - 261)

ධර්මයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක් ද යත්; රාගය, ද්වේෂය සහ මෝහය වෙයි.

මේ තුන් දහම් දුරු කිරීම (ප්‍රහාණය) පිණිස ධර්මයෝ තිදෙනෙක් වැඩිය යුතු වෙයි. කවර තිදෙනෙක් ද යත්;

1. රාගය දුරු කිරීම පිණිස අසුභය වැඩිය යුතුය.
2. ද්වේෂය දුරු කිරීම පිණිස මෛත්‍රිය වැඩිය යුතුය.
3. මෝහය දුරු කිරීම පිණිස ප්‍රඥාව වැඩිය යුතුය.